**මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**

**நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு**

**MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES**

| | | |
|---|---|---|
| මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka. |
| කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823 | වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date: 2024.01.02 |

## මාධ්‍ය නිවේදනය

### එකතු කළ අගය මත බදු (වැට් බදු) නිදහස් කිරීම්

මෙතෙක් පැවති එකතු කළ අගය මත බදු (වැට් බදු) නිදහස් කිරීම් හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 ක පමණ රාජ්‍ය ආදායමක් වාර්ෂිකව අහිමිවන බවට ඇස්තමේන්තු කර ඇත. එබැවින්, ආදායම් මූලික කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කර ගැනීමේ අරමුණින් 2024 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වැට් බදු නිදහස් කිරීම් බහුතරයක් අහෝසි කරමින් 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත 2023 දෙසැම්බර් 13 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

මීට පෙර, විවිධ භාණ්ඩ හා සේවා ප්‍රධාන අයිතම 138 ක පමණ වැට් බද්ද නිදහස් කර තිබූ අතර, මෙම නව සංශෝධන පනත මගින් අධ්‍යාපනය, සෞඛ්‍යය, පොදු ප්‍රවාහන, කෘෂිකර්මය යනාදී ආර්ථිකයේ ප්‍රධාන අංශ සහ අඩු ආදායම්ලාභී කුටුම්භවලට ඉහළ බලපෑමක් ඇති කරන භාණ්ඩ හා සේවා අයිතම 43 ක් පමණ තවදුරටත් වැට් බද්දෙන් නිදහස් කර ඇත (ඇමුණුම 1). එමෙන්ම, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වන අල, ලූනු, පරිප්පු, සීනි, මුං ඇට, කඩල, වියළි හාල්මැස්සන්, තිරිඟු පිටි යනා දී විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් අයිතම ද වැට් බද්දට යටත් නොවේ (ඇමුණුම 2).

මෙම සංශෝධන හරහා දැනට ක්‍රියාත්මක වන රජයේ ආදායම වැඩිකර ගනිමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම සඳහා ගෙන යන වැඩපිළිවෙලට විශාල දායකත්වයක් අපේක්ෂා කෙරේ.

මීට අමතරව, 2018 නොවැම්බර් 01 දිනැති 2095/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය හා 2022 ඔක්තෝම්බර් 06 දිනැති 2300/25 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ඇතැම් රෙදි වර්ග හා සනීපාරක්ෂක තුවා හා ටැම්පෝන් සඳහා ලබා දී ඇති ශුන්‍ය අනුපාතය (0%) සහිත වැට් බදු සහනය ඉවත් නොවේ.

ඇමුණුම 1

## වැට් බද්දෙන් නිදහස් භාණ්ඩ සහ සේවා

| සැපයීම හෝ ආනයනය කිරීම නිදහස් වන භාණ්ඩ |
|---|
| තිරිඟු, තිරිඟු පිටි |
| ළදරු කිරි පිටි |
| ඖෂධ නිෂ්පාදන, ඖෂධ වර්ග (සුවඳ විලවුන් හැර), ඖෂධ නිෂ්පාදන අමුද්‍රව්‍ය |
| ඖෂධ නිසන්ඩුවට අයත් ආයුර්වේද සංයෝග (සුවඳ විලවුන් හැර), යුනානි, සිද්ධ හෝ හෝමියෝපති සංයෝග, ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අමුද්‍රව්‍ය |
| පිරිපහදු නොකරන ලද ඛණිජ තෙල්, භූමි තෙල්, ගුවන් යානා ඉන්ධන, නැව් සඳහා භාවිතා කරන තෙල්, තෙල් ඉන්ධන |
| කෘත්‍රිම අත් පා, කිහිලිකරු, රෝද පුටු, ශ්‍රවණ උපකරණ, විකලාංග හෝ අශක්නුතාවන් සඳහා උපකාර පිණිස පළඳින/ සිරුරේ තැන්පත් කරන උපකරණ, අන්ධ තැනැත්තන් භාවිතා කරන සුදු සැරයටි, බ්‍රේල් යතුරු ලියන යන්ත්‍ර සහ කොටස්, බ්‍රේල් යතුරු ලියන කඩදාසි, බ්‍රේල් යතුරු ලියන පුවරු, ආබාධිතයන්ගේ ඉල්ලීම සලකා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබන වෙනත් යම් අයිතම |
| ජෛව පොහොර, ආටිමියා බිත්තර, පීට් පාසි |
| කාෂිකාර්මික බීජ, කෘෂිකාර්මික පැළ, ඉස්සන් සඳහා ආහාර, කුනිස්සන් සඳහා ආහාර, කුකුළන් සඳහා වන ආහාර හැර වෙනත් සත්ව ආහාර |
| රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කරන නූල් |
| අත්යන්ත්‍ර කර්මාන්තය සඳහා භාවිතා කරන වර්ණක (ඩයි) |
| **සැපයුම නිදහස්වන අයිතම** |
| අධ්‍යාපන සේවා |
| පොදු මඟී ප්‍රවාහන සේවා (ගුවන් ප්‍රවාහනය, ජලය මගින් ප්‍රවාහනය, සංචාරකයන් ප්‍රවාහනය සහ කුලී රථ සේවා හැර) |
| විදුලිබලය |
| භූමිදාන සහ ආදාහන කටයුතු සම්බන්ධ සේවා |
| බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ භෝජනාගාරයේ සපයනු ලබන සේවා |
| තානාපති වරප්‍රසාද අදාළ යම් දූත මණ්ඩලයකට සපයනු ලබන භාණ්ඩ සහ සේවා, හදිසි ආපදා සඳහා සහන සඳහා විදේශීය සංවිධාන සපයනු ලබන භාණ්ඩ හෝ සේවා |
| ජාතික ආර්ථිකයේ යහපත සඳහා විදේශීය සංවිධාන සපයනු ලබන භාණ්ඩ හෝ සේවා |
| මූල්‍ය සේවා |
| සෞඛ්‍ය සේවා (රෝහල් කාමර ගාස්තු හැර) |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත් භාණ්ඩ |
| දේශීය වශයෙන් නිෂ්පාදිත අත්යන්ත්‍ර රෙදිපිළි |
| දේශීය වශයෙන් නිෂ්පාදිත සහල්, සහල් පිටි සහ පාන් |
| ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත පිරිසැකසුම් නොකළ කෘෂිකාර්මික, උද්‍යාන විද්‍යාත්මක හෝ මත්ස්‍ය නිෂ්පාදන (තේ දළු, රබර් කිරි, පොල්, සියලු එළවළු, පළතුරු, කෘෂි භෝග, මාළු) |
| ශල්‍යකර්ම සඳහා භාවිතා කරනු ලබන දේශීය වශයෙන් නිෂ්පාදිත ගෝස් |

| |
|---|
| සෙස් බද්දට යටත්වන රෙදිපිළි |
| ශ්‍රී ලංකාවෙන් පිටත පරිභෝජනය කිරීමට ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් කරන සේවා |
| රෙදිපිළි හෝ ඇඟලුම්වල වටිනාකම ප්‍රවර්ධනයවීමක් සිදුවන සේවාවන් |
| වෘද්ධ සේවාවන් සහ ළමා සත්කාරක සේවාවන් |
| ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා |
| විදේශ ණය හෝ පරිත්‍යාග ලෙස යම් විශේෂිත ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ හෝ සේවා |
| යටිතල සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා සපයනු ලබන භාණ්ඩ සහ සේවා |
| ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයනු ලබන භාණ්ඩ හෝ සේවා |
| ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් අය කිරීමෙන් තොරව සපයනු ලබන සේවා |
| තීරු බදු රහිත සාප්පු සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ |
| **ආනයනය කිරීම නිදහස්වන භාණ්ඩ** |
| බදු රහිතව නිෂ්කාශනය කර ගැනීමට හිමිකම ඇති යම් අයිතමයක් |
| ප්‍රදර්ශන භාණ්ඩ හා තාක්ෂණික ලෙස නිරූපනයට යොදාගෙන ප්‍රති-අපනයනය කරනු ලබන භාණ්ඩ, ව්‍යාපෘතියක භාවිත කර ප්‍රති-අපනයනය කරනු ලබන භාණ්ඩ හෝ පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ |
| ගුවන්යානා එන්ජින් හෝ ගුවන්යානා අමතර කොටස් |
| විදුලිබල මණ්ඩලය වෙත ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සපයන රසායනික නැප්තා |
| තානාපති වරප්‍රසාද පනතේ දූත මණ්ඩලයකට සපයනු ලබන භාණ්ඩ සහ සේවා |
| විදේශ මුදලින් තීරු බදු රහිත සාප්පුවලට සැපයීම සඳහා භාණ්ඩ ආනයනය කිරීම සහ සැපයීම. |

ඇමුණුම 2

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතට අයත් භාණ්ඩ ලැයිස්තුව (2024.01.02 දිනට)**

1) වියළි හාල්මැස්සෝ
2) අර්තාපල්
3) රතු ලූනු
4) ලොකු ලූනු
5) සුදු ලූනු
6) වටානා පරිප්පු
7) කඩල
8) මුංඇට
9) පරිප්පු
10) වියළි මිරිස්
11) ටින් මාළු
12) සුදු සීනි
13) උඳු
14) කව්පි
15) කුරක්කන්
16) උම්බලකඩ
17) කරවල
18) කොත්තමල්ලි
19) සූදුරු
20) මහදුරු
21) කහ
22) උළුහාල්
23) කුරක්කන් පිටි
24) උඳු පිටි
25) රට කජු
26) අබ
27) පාම් තෙල්/පොල්තෙල් ඇතුළු අනෙකුත් එළවළු තෙල්
28) මාළු/ මැකරල් මාළු
29) යෝගට්
30) බටර්
31) මාගරීන්
32) ලුණු
33) රට ඉඳි

34) වීස්
35) බඩ ඉරිඟු
36) මුව ආවරණ
37) එළවළු මේදය සහ තෙල්
38) ද්‍රව මාගරීන්
39) සහල්
40) පළතුරු වර්ග